සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2016 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2016-07-16
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

"ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන් විසින් වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයේ දක්වා ඇති මූලික මූලධර්මවලට අනුකූල විය යුතුය."

(A) "අවංකභාවය" (Integrity) යනු වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයේ දක්වා ඇති මූලික මූලධර්මයකි.

මෙම මූලධර්මය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) වෘත්තියේ යෙදෙන්නෙකුට / විගණකයෙකුට (a practitioner / an auditor) ඉටුකළ හැකි සහතිකවීමේ කාර්යභාර (assurance engagements) වර්ග දෙක(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

"සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහය (Code of Best Practice on Corporate Governance) ප්‍රධාන කොටස් දෙකකට(02) බෙදිය හැකි අතර එහි සමාගමේ අධ්‍යක්ෂකවරුන්ගේ මෙන්ම කොටස්හිමියන්ගේ ඇතැම් වගකීම් නිශ්චිතව දක්වා ඇත. කොටස්හිමියන්ගේ භාරකරුවන් / නියෝජිතයන් (trustees/agents) ලෙස අධ්‍යක්ෂකවරුන් ක්‍රියාකරයි."

(A) "නියෝජිත ගැටුම" (Agency Conflict) යනු කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා වන මඟ පෙන්වීම් (guidelines) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

(A) විගණන ආයතනයක තත්ත්ව පාලන පද්ධතියක ඇති මූලිකාංග (elements) තුනක්(03) **සඳහන් කරන්න**.
(ලකුණු 03)

(B) **සීමාසහිත K සහ P (පෞද්ගලික) සමාගමේ** 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කරනු ලබන විගණන කණ්ඩායමේ සාමාජිකයෙකු වන **සමිත්** ට වර්ෂය තුළදී සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ වලට කරන ලද එකතු කිරීම් විගණනය කරන ලෙස උපදෙස් ලැබී ඇත. වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව, වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ වලට කරන ලද එකතු කිරීම් ප්‍රමාණාත්මක ලෙස සැලකිය හැකිය.

දේපළ, පිරියත සහ උපකරණ වල පැවැත්ම (existence) සත්‍යාපනය කිරීම සඳහා **සමිත්** විසින් ඉටුකරනු ලැබිය හැකි විගණන ක්‍රියාපටිපාටියක් **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

"ඇතැම් ගිණුම් ශේෂ සහ ගනුදෙනු සම්බන්ධයෙන් විගණක විසින් තෙවැනි පාර්ශවයන්ගෙන් සනාථ කිරීම් ලබා ගනු ලැබේ."

(A) විගණක විසින් බාහිර සනාථ කිරීම් භාවිත කරනු ලබන අවස්ථාවන් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(B) විගණක විසින් බාහිර සනාථ කිරීම් ලබා ගැනීම සඳහා යවන ලද ඉල්ලීමකට අදාල ප්‍රතිචාරයක විශ්වාසවන්තභාවය පිළිබඳ සැකයක් ඇති කරන බව හඟවන සාධකයක් **හඳුනා දක්වන්න.** (ලකුණු 01)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත රන්මල් ලංකා (පෞද්ගලික) සමාගම (RLPL)** පිරිවැය රු.මිලියන 600 ක් වූ ගොඩනැගිල්ලක් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය තුළදී ඉදිකරන ලදී. මම ගොඩනැගිල්ල වර්ෂය තුළදී භාවිත කළ නමුත් ප්‍රාග්ධනගත කර නොමැති බව **RLPL සමාගමේ** විගණකට පෙනී ගියේය. ගොඩනැගිල්ලේ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන නොනිම්-වැඩ ලෙස පෙන්වා තිබුණි. ගොඩනැගිල්ලේ පිරිවැය නිවැරදිව ප්‍රාග්ධනගත කර තිබුණේනම්, වර්ෂය සඳහා රු. මිලියන 15 ක වැඩිපුර ක්ෂය අයකිරීමක් තිබෙනු ඇත. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **RLPL සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ලාභය රු. මිලියන 90 කි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(A) **RLPL සමාගමේ** විගණකවරයාගේ වාර්තාව කෙරෙහි ඉහත සඳහන් කරුණු බලපාන ආකාරය **පැහැදිලි කරන්න**.
(ලකුණු 04)

(B) විගණකවරයාගේ වාර්තාවක "කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක්" යනු කුමක්දැයි **පැහැදිලි කරන්න**.
(ලකුණු 03)

(C) විගණකවරයාගේ වාර්තාවක "හැඳින්වීමේ ඡේදයෙහි" සඳහන් කර ඇති වැදගත් කරුණු තුනක්(03) **සඳහන් කරන්න**.
(ලකුණු 03)
(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත ස්මයිල් සුපර් (පෞද්ගලික) සමාගමේ (SSPL),** විගණකවරයා ලෙස **KK අසෝසියේට්ස්** පත්කරන ලදී. SSPL සමාගමේ විගණනය භාර හවුල්කරු වන **කමල්,** තම විගණන කණ්ඩායම සමග පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී:

(1) විගණන වැඩ ආරම්භ කිරීමට පෙර විගණක විසින් SSPL සමාගම, එය යෙදී සිටින කර්මාන්තය සහ පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ වැදගත්කම.

(2) විගණනය සම්බන්ධයෙන් ඉටුකළ වැඩ සහ රැස්කර ගනු ලැබූ විගණන සාක්ෂි පිළිබඳව ජංගම විගණන ලිපිගොනුවේ කාලෝචිත වාර්තා පවත්වාගැනීමේ වැදගත්කම.

(3) විගණන කටයුතු සිදු කිරීමේදී විශේෂයෙන් වංචා පිළිබඳව අවධානය යොමුකිරීමේදී වෘත්තීය සංශය දෘෂ්ඨිය (professional skepticism) භාවිත කිරීම.

(4) විගණනයේ හමුවන වැදගත් අවදානම් සහිත ක්ෂේත්‍ර (significant risk areas).

**කමල්,** පහත සඳහන් ක්‍රියාපටිපාටීන් ඉටු කරන ලෙස විගණන කණ්ඩායමට උපදෙස් දෙන ලදී:

**(I)** විකුණුම් සඳහා පිටමං ක්‍රියා පිළිවෙත (sales cut-off).

**(II)** ඉන්වොයිස් නියැදියක් තෝරාගෙන ඒවා අනුමත කර තිබේද යන්න පරීක්ෂා කිරීම.

**(III)** දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.

**(IV)** තෝරාගත් ණයගැතියන්ගෙන් 2016 මාර්තු 31 දිනට ඇති හිඟ ශේෂයන් පිළිබඳව සෘජු සනාථ කිරීම් කැඳවීම.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(A) ජංගම විගණන ලිපිගොනුවේ අඩංගු වන ලියවිලි තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(B) SSPL සමාගමේ විගණන කණ්ඩායමට එම සමාගම, එය යෙදී සිටින කර්මාන්තය සහ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි මාර්ග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(C) ඉහත සඳහන් සංසිද්ධියේ (I) සිට (IV) දක්වා ලැයිස්තුගත කර ඇති එක් එක් ක්‍රියාපටිපාටියෙන් අවධානය යොමු කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සැඳහුම **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(A) "සංවිධානයකට අභ්‍යන්තර පාලන පද්ධතිය වැදගත් වේ."

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) කෝසෝ [Committee of Sponsoring Organizations (COSO)] අභ්‍යන්තර පාලන පද්ධති ආකෘතිරාමුවේ ඇති සංරචක දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(B) **සීමාසහිත ජයා එක්ස්පෝට්ස් (පෞද්ගලික) සමාගම (JEPL)** පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනයේ නිරතව සිටී. සමාගම ඔවුන්ගේ ප්‍රධාන නිෂ්පාදිත ජර්මනියට අපනයන කරනු ලබන අතර ඇතැම් අතුරු නිෂ්පාදිතයන් වන පොල්කටු සහ වියලි පොල් වැනි දෑ දේශීය වෙළෙඳපොළට විකුණනු ලබයි.

පොල්කටු මිලදී ගන්නා ගනුදෙනුකරුවන් බොහෝවිට අත්පිට මුදල් ගෙවනු ලබයි. මෙම සමාගමේ ගණකාධිකාරිවරිය වන **අමාලි** ගනුදෙනුකරුවන්ගෙන් මුදල් එකතුකර ගැනීම පිළිබඳ වගකීම දරයි. මෙම ලැබීම් මුදල් ලැබීම් ලෙස සුළු මුදල් පොතක ඇය සටහන් කර එදිනෙදා වියදම් දැරීම සඳහා මෙම මුදල් යොදා ගනී.

**JEPL** සමාගමෙන් සමහර දේශීය ගනුදෙනුකරුවන් වියලි පොල් අයිතමන් මිලදී ගෙන ඒ සඳහා ගෙවීම්, මුදල් චෙක්පත් (cash cheques) මගින් සිදුකරනු ලැබේ. **අමාලි** මෙම මුදල් චෙක්පත් බැංකුවෙන් මාරුකර මුදල් ලබාගෙන ඒවා සුළු මුදල් පොතේ මුදල් ලැබීම් ලෙස සටහන් කර ගනී.

සියලුම විදේශීය ගැනුම්කරුවන් ඔවුන්ගෙන් අයවිය යුතු මුදල් සමාගමේ ඇමරිකානු ඩොලර් බැංකු ගිණුම (USD Bank Account) හරහා සෘජුවම නිරවුල් කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) ඉහත විස්තර කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතියේ ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) **JEPL** සමාගමේ කළමනාකාරිත්වය විසින් ඉහත (a) හි හඳුනාගෙන ඇති එක් එක් දුර්වලතාවය මගහරවා ගන්නේ කෙසේදැයි යන්නට නිර්දේශයක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

(A) "විගණන සාක්ෂිවල යෝග්‍ය බව (appropriateness) යන්න විගණන සාක්ෂිවල ගුණාත්මක බවට හෝ විශ්වසනීය බවට සම්බන්ධ වේ."

විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා භාවිත කරන විගණන ක්‍රියාපටිපාටීන් වර්ග හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(B) (a) **සීමාසහිත සොලිඩ් ටයර්ස් (පෞද්ගලික) සමාගම (ST)** ටයර් නිෂ්පාදනය කර අපනයනය කරයි. පහත සඳහන් තොරතුරු **ST** සමාගමට අදාළ වේ:

| | **මාර්තු 31 දිනට** | |
|---|---|---|
| | **2016 (රු.)** | **2015 (රු.)** |
| අමුද්‍රව්‍ය | 414,300 | 364,250 |
| නොනිමි වැඩ | 154,420 | 95,610 |
| නිමි භාණ්ඩ | 267,780 | 275,200 |
| **එකතුව** | **836,500** | **735,060** |

2016 මාර්තු 31 දිනෙන් සහ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයන් සඳහා විකුණුම් පිරිවැය පිළිවෙලින් රු.8,700,000/- ක් සහ රු.9,400,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන 2016 මාර්තු 31 දිනට **ST** සමාගමේ තොග පිළිබඳව විගණකට ඉටුකළ හැකි විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටීන් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **අරවින්ද, ST** සමාගමේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ විගණනය භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ විගණකයා වේ. **ST** සමාගමේ ණයගැතියන්ට දින 60 ක ණය කාලයක් ප්‍රදානය කරනු ලැබේ. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රාග්ධන වියදම් අයවැය ඇතුළුව වාර්ෂික අයවැය අනුමත කර ඇත.

(1) **අරවින්ද,** 2016 මාර්තු 31 දිනට හිඟව ඇති ණයගැතියන් 60 දෙනාගෙන් ලැබිය යුතු ශේෂයන් සනාථ කරවා ගැනීම සඳහා සෘජු සනාථ කිරීම් කැඳවීමට ණයගැතියන් 10 දෙනෙකු තෝරාගන්නා ලදී. ණයගැතියන් දෙදෙනෙකුගෙන් පමණක් ඊට පිළිතුරු ලැබුණ අතර ඔවුන් සනාථ කළ ශේෂයන් **ST** සමාගමේ ගිණුම් වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ එකඟ නොවීය.

(2) 2016 මාර්තු මාසය සඳහා පිළියෙල කරන ලද වැටුප් වාර්තා (payroll) **අරවින්ද** විසින් සමාලෝචනය කරන ලද අතර 2016 මාර්තු මාසය සඳහා ලෙජර ගිණුමට අනුව ශුද්ධ වැටුපේ ප්‍රමාණයත් එම මාසය සඳහා වැටුප් වාර්තා මඟින් ගණනය කරන ලද ශුද්ධ වැටුපේ ප්‍රමාණයත් අතර රු. මිලියන 1 ක වෙනසක් ඇති බව ඔහුට දක්නට ලැබුණි.

(3) දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා වූ මිලදී ගැනීමේ ඇණවුම් [Purchase orders (PO)] කළමණාකාර අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබේ. කෙසේවුවද රු. මිලියන 80 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව අනුමත කරන ලද මිලදී ගැනීමේ ඇණවුම විගණකට ඉදිරිපත් කර නොතිබුණි.

(4) **ST** සමාගම මූල්‍ය වර්ෂය තුළ දේපළ, පිරියත සහ උපකරණ භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දැ,**

ඉහත (1) සිට (4) තෙක් දක්වා ඇති එක් එක් කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා **ST** සමාගමේ විගණකයන්ට ඉටුකළ හැකි අතිරේක විගණන ක්‍රියාපටිපාටින් දෙක(02) බැගින් **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 08)

(C) **සීමාසහිත සොලිඩ් ටයර්ස් (පෞද්ගලික) සමාගමේ** වෙළෙඳ ණයගැතියන්ගේ ශේෂ සනාථ කිරීම් පිළිබඳව ඉටුකරන ලද වැඩ සම්බන්ධයෙන් විගණන ලිපිගොනුවේ ඇති එකම වැඩ පත්‍රිකාව පහතින් දී ඇත:

| | | | |
|---|---|---|---|
| **සේවාදායකයා:** | | පිළියෙල කළේ: | *සරත්* |
| **විස්තරය:** | ***වෙළෙඳ ණයගැතියන්*** | දිනය: | 2016.05.25 |
| | | සමාලෝචනය කළේ: | |
| | | දිනය: | |

**සනාථ කිරීම් - *වෙළෙඳ ණයගැතියන්***

| | **රු.'000** |
|---|---|
| වෙළෙඳ ණයගැතියන් | 12,500 |

**කළ වැඩ**

*සෘජු සනාථ කිරීම් කැඳවන ලදී.*

**ප්‍රතිඵලය**

*සනාථ කිරීම් දෙකක් ලැබුණි.*

ඉහත දෙන ලද වැඩ පත්‍රිකාවේ දක්නට ලැබෙන දුර්වලතා පහක්(05) **හඳුනා දක්වන්න** (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## **09 වන ප්‍රශ්නය**

(A) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ **සීමාසහිත බිලූ බෙරි (පෞද්ගලික) සමාගමේ (BB),** බාහිර විගණකවරුන් ලෙස **සිදත් ඇසෝසියේට්ස්** (වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක්) පත් කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) BB සමාගමේ බාහිර විගණකයන් ලෙස පත්වීම බාර ගැනීමට පෙර **සිදත් ඇසෝසියේට්ස්** විසින් අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටීන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) විගණනය බාර ගැනීමේ ක්‍රියාපටිපාටින් සම්පූර්ණ කිරීමෙන් පසු BB සමාගමට යැවීම සඳහා කෙටුම්පත් සේවයේ යෙදවීමේ ලිපියක් (engagement letter) **සිදත් ඇසෝසියේට්ස්** හි කණිෂ්ඨ විගණකයෙකු විසින් පිළියෙල කරන ලදි. එම කෙටුම්පත් සේවයේ යෙදවීමේ ලිපියේ උද්ධෘතයක් පහතින් දී ඇත:

> දිනය: ………..….
>
> අධ්‍යක්ෂක මණ්ඩලය
>
> **සීමාසහිත බිලුබෙරි (පෞද්ගලික) සමාගම.**
>
> හිතවත් මහත්වරුණි,
>
> **සේවයේ යෙදවීමේ ලිපිය**
>
> ඔබ සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයද, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු විගණනය කරන ලෙස ඔබ විසින් අපවෙත ඉල්ලීමක් කර ඇත. එම කාර්යභාරය අප සතුටින් බාරගන්නා බව සහ මෙම කාර්යය පිළිබඳ අපගේ අවබෝධය මෙම ලිපිය මගින් තහවුරු කරනු කැමැත්තෙමු. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් යුතුව අපගේ විගණනය සිදුකරනු ලැබේ.
>
> **කළමනාකරණයේ වගකීම:**
>
> පහත සඳහන් දෑ සඳහා වගකීමක් ඇති බව කළමනාකරණය හෝ පාලනය භාරව සිටින තැනැත්තන් පිළිගෙන ඇති බවට සහ අවබෝධ කරගෙන ඇතැයි යන පදනම මත අපගේ විගණනය සිදුකරනු ලැබේ.
>
> (a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම.
>
> (b) වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන කිරීමට හැකියාව ලබාදීම සඳහා අවශ්‍ය වේ යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් පවත්වා ගැනීම; සහ,
>
> (c) පහත සඳහන් දෑ විගණකවරයාට සැපයීම:
>
> (i) වාර්තා, ලේඛන සහ අනෙකුත් කරුණු වැනි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ යැයි කළමනාකරණය තීරණය කරනු ලබන සියලුම තොරතුරු;
>
> (ii) විගණන අරමුණ සඳහා අවශ්‍ය වන අප විසින් ඉල්ලුම් කරන අමතර තොරතුරු සැපයීමට; සහ
>
> (iii) විගණන සාක්ෂි ලබාගැනීමට යෝග්‍ය වේ යැයි අප විසින් තීරණය කරන සමාගමේ අදාල පුද්ගලයන්ට බාධාවකින් තොරව ප්‍රවේශවීමේ අයිතිය ලබාදීම.
>
> සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට සහ වංචා, සහ වැරදි සහ නියාමන රෙගුලාසි වලට අනුකූල නොවීම් වැළැක්වීම හා අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරු වගකීමෙන් බැඳේ.
>
> විගණනය අතරතුර අපි ඔබගේ සේවක මණ්ඩලයෙන් පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.
>
> **සිදත් ඇසොසියේට්ස්**
>
> වරලත් ගණකාධිකාරීවරු
>
> ………………………….. සමාගම වෙනුවෙන් බාර ගතිමි.

ඉහත දී ඇති කෙටුම්පත් කරන ලද සේවයේ යෙදවීමේ ලිපියේ ඇති දුර්වලතා හයක්(06) **හඳුනා දක්වන්න**. (ලකුණු 06)

(B) **සීමාසහිත රන්හිරු (පෞද්ගලික) සමාගම,** එහි ගිණුම්කරණ කාර්යය මෑතකදී පරිගණකගත කරන ලදී. නව පද්ධතියට මාරු වීමට ප්‍රථමයෙන් සමාන්තර ධාවනයක් (parallel run) ක්‍රියාත්මක නොකළ අතර 2016 මාර්තු 31 දිනට පැවති ශේෂයන් වහාම 2016 අප්‍රේල් 01 දින නව පද්ධතියට මාරු කර මෙහෙයුම් කටයුතු දිගටම කරගෙන යන ලදී. 2016 අප්‍රේල් 01 දින නව පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ කාර්ය මණ්ඩලය අතර රාජකාරි බෙදා වෙන් කරන ලදී.

සමාගමේ පද්ධති සංවර්ධන නිලධාරී විසින් ඔහුගේ කාර්යභාරය අවසන් කළ වහාම යෙදවුම් වල සම්පූර්ණත්වය මත පාලනයන් (controls over input completeness) සහ යෙදවුම්වල නිරවද්‍යතාවය මත පාලනයන් (controls over input accuracy) වැනි පාලනයන් ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) යෙදවුම්වල සම්පූර්ණත්වය මත පාලන සඳහා උදාහරණ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) යෙදවුම්වල නිරවද්‍යතාවය මත පාලන සඳහා උදාහරණ හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(C) "සාමාන්‍යයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ ව්‍යාපාර අස්තිත්වයට අඛණ්ඩ පැවැත්මක් ඇති බවත් දුර දැකිය හැකි අනාගතයක් දක්වා ව්‍යාපාර කටයුතු වල නියැලී සිටිනු ඇතැයි යන උපකල්පනය මතයි. එමනිසා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සමාලෝචනය කිරීම විගණනයේ ඉතා වැදගත් කොටසකි."

(a) අස්තිත්වයක අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය කෙරෙහි සැලකිය යුතු තරම් සැක පහළ කෙරෙන මෙහෙයුම් ඇඟවීම් (operating indicators) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සමාලෝචනය ඉටු කිරීමේදී විගණකට අනුගමනය කළ හැකි විගණන ක්‍රියාපටිපාටීන් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |